# දක්ෂයින් ඉදිරියට ඒම වලක්වන්න ආර්ථික හේතු වැදගත් නෑ........

**විදේශ සේවා නියුක්ති කාර්යාංශ සභාපති කියයි.**




නිදහස් අධ්‍යාපනයෙන් ලැබෙන ශක්තිය අනගිභවනීය වන බවත්, එතුලින් මෙරටට උගත් බුද්ධිමතුන් රැසක් බිහිවී ඇති බවත්, ශ්‍රී ලංකා විදේශසේවා නියුක්ති කාර්යාංශයේ සභාපති නීතිඥ නන්දපාල වික්‍රමසූරිය මහතා ප්‍රකාශ කරයි.  ශ්‍රී ලංකාවට බුද්ධිතුන්ගේ බරපතල අවශ්‍යතාවයක් පවතින අතර, නිදහස් අධ්‍යාපනය තුලින් රටට අවශ්‍ය බුද්ධිමතුන් බිහි කිරීමට රජය මෙන්ම පෞද්ගලික ආයතනයද උදව් කළ යුතු බවද ඔහු කියා සිටී. විදේශ ගත ශ්‍රමිකයින් ගේ දරුවන් වෙනුවෙන් ආරම්භ කොට තිබෙන ශිෂ්‍යත්ව ක්‍රමය ඊට බොහෝ සෙයින්, උපකාරයක් බවද ඔහු සඳහන් කළේය. 2013 හා 2014 විගමනික ශ්‍රමිකයින්ගේ දූදරු ශිෂ්‍යත්ව පිරිනැමීම පිළිබඳව අදහස් දක්වමින් ඔහු මෙම අදහස් ප්‍රකාශ කළේය. ඒ, ගම්පහ සුමේධ විද්‍යාලයේ ඊයේ පැවති උත්සවයේදීය. එහිදී ඔහු වැඩිදුරටත් අවධාරණය කළේ, විගමනික ශ්‍රමිකයින් වෙනුවෙන් නව රජය යටතේ තව දුරටත් සුබසාධන පහසුකම් පුළුල් කරන බවයි. මෙවර ශිෂ්‍යත්ව ලබා දීම සඳහා රජය රුපියල් අටකෝටියකට (84,575,000/=) අධිකමුදලක් වැයකරන අතර, එමඟින් සිසුන් 4400ට සෘජුවම ප්‍රතිලාභ ලබා දෙන බවද ඔහු සඳහන් කළේය.

යහපාලනය තුළින් රට ඉදිරියට යන මෙහොතක අලුත් දේශපාලන සංස්කෘතියක් ඇතිවී තිබෙන අතර, රටට දක්ෂයින් අවශ්‍ය වන්නේ මේ මොහොතේ  බවද ඔහු කියා සිටියේය. එවැනි දක්ෂයින් බිහිකිරීමට ආර්ථික හේතු බලපාන්නේ නම් ඒ සඳහා විසඳුම්

ලබාදීමට රජයේ වගකීමක් මෙන්ම සමාජ වගකීමක් බවද ඔහු පෙන්වා දෙයි. එයට එක් පිළියමක් ලෙස විගමනික ශ්‍රමිකයින්ගේ දූදරුවන්ට ශිෂ්‍යත්ව ලබාදෙන අතර, ඔවුන්ගේ අධ්‍යාපන ප්‍රගතිය පිළිබඳව නිරතුරුව සොයා බලන බවද ඔහු අනාවරණය කළේය. ඒසේම විගමනික ශ්‍රමිකයින්ට, විදේශ රටවලදී ඇතිවෙන ගැටලු සඳහා කඩිනම් විසදුම් ලබාදීමටද, එරටදී ලබාදෙන සුබසාධන පහසුකම් තවදුරටත් වැඩිකිරීමටද අදහස් කරන බව ඔහු කියා සිටියේය.

නව රජය යටතේ අනවශ්‍ය වියදම් අඩු කරනමුත්, විගමනික ශ්‍රමිකයින්ගේ සුබසාධන පහසුකම් කිසිලෙසකවත් අඩු නොකරන බවද ඔහු වැඩිදුරටත් අවධාණය කළේය.